# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

2019 නොවැම්බර් 06

අතිගරු ජනාධිපතිතුමා
ජනාධිපති ලේකම් කාර්යාලය
කොළඹ

ගරු ජනාධිපතිතුමනි,

**මැතිවරණ සමයේ රූපවාහිනී ආයතන විසින් මාධ්‍ය උපමාන අනුගමනය කිරීම තහවුරු කිරීම සඳහා විෂය භාර අමාත්‍යවරයා ලෙස පියවර ගන්නා ලෙස කරනු ලබන ඉල්ලීමයි.**

මැතිවරණ කොමිෂන් සභාව විසින් 2019 සැප්තැම්බර් 21 දින අංක 2141/87 අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104(ආ)(4)(අ) ව්‍යවස්ථාව යටතේ මැතිවරණ සමයේදී සියලුම මාධ්‍ය විසින් අනුගමනය කල යුතු මාධ්‍ය උපමාන පනවා ඇති නමුත් ඇතැම් රූපවාහිනී නාලිකාවන් එම මාධ්‍ය උපමාන සඳහා ගරු කිරීමක් සිදු නොකරන බව පෙනී යයි.

මෙම තත්ත්වය නිදහස් හා සාධාරණ මැතිවරණයක තිබිය යුතු සමබිම පවත්වාගැනීම සඳහා බාධාවක් බව අපගේ හැඟීමයි. රාජ්‍යය සතු රූපවාහිනී නාලිකාවන් පිළිබඳව පාලනය සම්බන්ධව නීතිමය කටයුතු කිරීමේ හැකියාවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මැතිවරණ කොමිෂන් සභාවට පවතින නමුත් පුද්ගලික නාලිකාවන් මාධ්‍ය උපමාන කඩකිරීම සම්බන්ධව නීතිමය පියවර ගැනීමේ හැකියාවක් මැතිවරණ කොමිෂන් සභාවට නොමැති බව කොමිෂන් සභාව විසින් කිහිප වරක්ම ප්‍රකාශ කර තිබේ.

එසේම මැතිවරණ කොමිෂන් සභාව විසින් 2019 සැප්තැම්බර් 19 වන දින නිකුත් කරන ලද අංක 2141/52දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් පොදු දේපල අයථා භාවිතාව පිළිබඳව **නියමයන් 7 III** හි දක්වන්නේ "සියලුම පෞද්ගලික කේබල් රූපවාහිනි නාලිකා, පෞද්ගලික විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන, වෙබ් අඩවි, ජංගම හා ස්ථාවර දුරකථන සේවා සපයන ආයතන ඡන්ද විමසීම් කාලසීමාවේ දී මැතිවරණ නීති උල්ලංඝනය නොවන පරිදි සහ මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කොට ඇති මාධ්‍ය උපමාන, විධාන හා උපදෙස් චක්‍රලේඛවලට අනුකූලව ක්‍රියා කරන බවට වගබලා ගැනීම උක්ත සන්නිවේදන ආයතන **නියාමනය කරනු ලබන ආයතනවල** වගකීමක් විය යුත්තේය". බවයි.

#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.
Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572
Email : paffrel@sltnet.lk Web : www.paffrel.com

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත හා 2019 සැප්තැම්බර් මස 9 දින හා අංක 2140/2 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව සියලුම රූපවාහිනී විකාශනයන් සම්බන්ධයෙන් නියාමන වගකිම පැවරී ඇත්තේ ආරක්ෂක අමාත්‍යාංශය වෙත හා ආරක්ෂක අමාත්‍යවරයාද වන ඔබතුමාට බව අවධාරණය කරමි.

එබැවින් සියලුම රූපවාහිනී නාලිකාවන් මැතිවරණ කොමිෂන් සභාවේ මාධ්‍ය උපමාන අනුගමනය කල යුතු බවට වන නියෝගයක් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතේ 31 වන වගන්තිය යටතේ පනවන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

ස්තූතියි.

විශ්වාසී,



රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂක

පිටපත් -

සභාපතිතුමා, මැතිවරණ කොමිෂන් සභාව, සරණ මාවත, රාජගිරිය.

අධ්‍යක්ෂ ජෙනරාල්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, නො.276, ඇල්විටිගල මාවත, කොළඹ 08.